# නව රියදුරු වරදට - දඬුවම් ලකුණු ක්‍රමය

හෙල්මට් නැත්නම් ලකුණු 4

ෆෝන් කර කර ගියොත් ලකුණු 4

ඇක්සිඩන්ට් එකකදි පැන ගියොත් ලකුණු 10

# එකතුව 24 නම් ලයිසන් කැන්සල්

පසුගිය බ්‍රහස්පතින්දා පාර්ලිමේන්තුවේදී සම්මත කරගත් නව රියදුරු නීතිමාලාව අනුව පාරේදී සිදුවන වැරදි වලට දඬුවම් ලකුණු දීමේ ක්‍රමයක් ලංකාවේ ස්ථාපිත කරන්නට නියමිතය“

ඒ අනුව රියදුරන්ගේ විවිධ ධාවන වැරදි වලට එක් එක් ආකාරයට දඬුවම් ලකුණු හිමිවන අතර සෑම රියැදුරෙකුගේම දඬුවම් ලකුණු වාර්ෂිකව එකතුකිරීමේ ක්‍රමයක්ද ක්‍රියාත්මක වෙනවා“ නව ක්‍රමය අනුව සෑම වසර 2 කට වරක්ම රියදුරු බලපත්‍රය අලුත්කිරීමට අවශ්‍ය වන අතර වර්ෂ දෙකක් අවසානයේ දඬුවම් ලකුණු 18 ට අඩුවෙන් ලබා තිබේ නම් ගැටලුවකින් තොරව එය අලුත් කිරීමට අවකාශ සැලසේ“

ලකුණු 18-23 අතර ලබාගන්නා රියදුරන් කොමසාරිස්වරයාගේ අවවාදය සහිතව රියදුරු බලපත්‍රය අලුත් කරගැනීමට සිදුවන අතර 23 ට වැඩියෙන් දඬුවම් ලකුණු ලබා තිබෙන අයගේ බලපත්‍රය නැවත අලුත් නොකර වසරක කාලයකට අත්හිටුවන්නටද නියමිතය“

මෙම ලකුණුදීමේ ක්‍රමය සමග වර්තමාන දඩ ගැසීමේ ක්‍රමයද එලෙසම ක්‍රියාත්මක වන අතර රියදුරෙකු දිගින් දිගටම වැරදි කිරීමේ අවස්ථාව අහිමිවී යාම මෙහි ඇති වාසියයි“

මෙම ලකුණු දීමේ ක්‍රමයට පාර්ලිමේන්තු අනුමැතිය ලැබී ඇති හෙයින් එය ඉක්මණින් ක්‍රියාත්මක කරන්නට රජය බලාපොරොත්තු වන අතර එයට ප්‍රථම පරිගණකගත ලකුණු එක් රැස් කිරීමේ ක්‍රමවේදයක්ද පිහිටුවන්නට නියමිතය“පහත පළවන්නේ දැනට යෝජනාවී තිබෙන ලැයිස්තුවේ සඳහන් වැරදි හා දඬුවම් ලකුණු සංඛ්‍යාවන්ය“රියදුරු වැරදි හා යෝජිත දඬුවම් ලකුණු

| | |
|---|---|
| 1 අනතුරක් වැළැක්වීමට උත්සාහ නොකිරීම | (දඬුවම් ලකුණු 6) |
| 2 අවදානම් සහගත තැන්වල වේගයෙන් ධාවනය | (දඬුවම් ලකුණු 8) |
| 3 අධිවේගී මාර්ගයේ නොසැලකිලිමත් ධාවනය | (දඬුවම් ලකුණු 8) |
| 4 අනතුරක් සිදුවූ පසු නොනැවති ධාවනය | (දඬුවම් ලකුණු 10) |
| 5 අනතුරක් වූ පසු ළ!ගම පොලිසියට දන්වා නොතිබීම | (දඬුවම් ලකුණු 10) |
| 6 වේග සීමා අභිබවා ධාවනය | (දඬුවම් ලකුණු 6) |
| 7 පාරේ වම් ධාවන තීරුවේ ධාවනය නොකිරීම | (දඬුවම් ලකුණු 2) |
| 8 පාර පැහැදිලි නැති තැනක වැරදි ලෙස ඉස්සරකිරීම | (දඬුවම් ලකුණු 6) |
| 9 වැරදි පැත්තෙන් ඉස්සර කිරීම | (දඬුවම් ලකුණු 4) |
| 10 දකුණු පස වාහනයට ඉඩ නොදීම | (දඬුවම් ලකුණු 4) |
| 11 අහේතුකව අධිවේගී මාර්ගයේ දිගු දුරක් පසුපස පැදවීම | (දඬුවම් ලකුණු 4) |
| 12 මාර්ග සලකුණු නොතකාහැරීම | (දඬුවම් ලකුණු 6) |
| 13 පොලිස් සලකුණු දැක්වීම් හා වාචික විධාන නොතකා හැරීම | (දඬුවම් ලකුණු 6) |
| 14 නියමිත පරිසර පරීක්ෂණ අසමත් වාහන ධාවනය | (දඬුවම් ලකුණු 6) |
| 15 නියමිත ශබ්දයන්ට වැඩි හ' නගන වාහන ධාවනය | (දඬුවම් ලකුණු 6) |
| 16 තහනම් තැන්වල හෝන් ගැසීම | (දඬුවම් ලකුණු 6) |
| 17 පුද්ගලයකුට වාහනයකට හෝ මාර්ගයට හානිකර ප්‍රමිතියෙන් තොර වාහන භාවිතය | (දඬුවම් ලකුණු 10) |
| 18 ආසන ආරක්ෂණ පටි නොපැළඳීම | (දඬුවම් ලකුණු 3) |
| 19 වංගු-ද්විත්ව ඉරි ආදී තහනම් තැන්වල වාහන ඉස්සර කිරීම | (දඬුවම් ලකුණු 4) |
| 20 කහ ඉරි අසළදී වාහන නැවැත්වීමට අසමත්වීම | (දඬුවම් ලකුණු 6) |
| 21 හෙල්මට් නැතිව මෝටර් සයිකල පැදවීම | (දඬුවම් ලකුණු 4) |
| 22 සෙල්ෆෝන ආදී උපකරණ අතින් පරිහරණය කරමින් වාහන ධාවනය | (දඬුවම් ලකුණු 4) |